මගේ අංකය :- SP-PSC/34/LI/05/01
දකුණු පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
6 වන මහල,
ගාල්ල.
2025.04. 21

දකුණු පළාත් ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු සේවා/ සැලසුම් හා මෙහෙයුම්),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**කුසලතා පදනම මත දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2025**

01. දකුණු පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 192 දරන හා 2014.09.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2015.03.25 හා 2017.11.28, 2018.11.02, 2020.02.25 සහ 2021.02.22 දිනැතිව සංශෝධිත දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව 2024.12.31 දිනට පවතින දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 50% කට නොවැඩි ප්‍රමාණයක් කුසලතා මත උසස් කිරීම මඟින් සම්පූර්ණ කරනු ලැබේ. මේ සඳහා තරග විභාගයක් හා සේවයේ I වන ශ්‍රේණියට ඇතුළත් වූ දිනයෙන් පසු කාලය තුළ ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද පිළිබඳ ඇගයීමත් උපයෝගී කර ගනු ලැබේ.

02. මේ සඳහා පවත්වනු ලබන තරග විභාගය (ලිඛිත පරීක්ෂණය) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2025 අගෝස්තු මස මාතර නගරයේදී පවත්වනු ලැබේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 MN 7-2025 වැටුප් ඛණ්ඩය මෙම තනතුරට හිමිවන අතර ඒ අනුව, මාසික වැටුප් පරිමාණය රු. 71,240 - 11 X 1,360 - 18 X 1,850 – 119,500 වේ.

03. **සුදුසුකම් - :**

2025.05.20 දිනට දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කර ඇති හා රජයෙන්/වෙනත් පළාත් සභාවලින් දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන ලද,

i. නියමිත දිනට සේවයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම, උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. එදිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.

iii. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම යන සුදුසුකම් සැපිරිය යුතුය

04. **අයදුම් කිරීමේ ක්‍රමය - :**

(අ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව විය යුතු අතර, එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද 05 සිට 09 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මඟින් ද ලබා ගත හැකිය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතු ය.

(ආ) අපේක්ෂකයන්ට තමන් සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අයදුම්පත සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කළ යුත්තේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්මය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඇ) අපේක්ෂකයින් විසින් සම්පූර්ණ කර එවන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්, **2025.05.20** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, 6වන මහල, ගාල්ල."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර එවීමේදී ඒවා බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කුසලතා මත දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඈ) නිලධාරීන් විසින් සම්පූර්ණ කළ අයදුම්පත් තම කාර්යාලයට ලද දිනයේදීම කාර්යාලයීය දින මුද්‍රාව තැබීමත් ඒවායේ අදාළ කොටසේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහතික කර, සහතික කළ දිනය ද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර යථෝක්ත ලිපිනයට ලැබෙන සේ එවීමත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීමයි.

(ඉ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහරිනු ලැබ ඇති/සේවය සඳහා ද්විතීයනය කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කොට ඉහත දැක්වෙන ආකාරයට එවිය යුතුය.

(ඊ) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත්‍ර පිළිබඳව ද පැමිණිලි සලකා බලනු නොලැබේ.

05. **විභාගයට ඇතුළත්වීම :-**

(අ) ලිඛිත පරීක්ෂණය සඳහා වන අයදුම්පත් ඉදිරිපත් කරන ලද සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහන සහිත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) විභාග අපේක්ෂකයන් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) පළමුවන වරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් විභාගයට පෙනී සිටින්නේ නම් මෙම විභාගයේ විභාග ගාස්තු ලෙස රු. 600.00 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවේ ගිණුම් **අංක 87262909** දරන **ලේකම්,**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත** යන ජංගම ගිණුමට බැර කළ යුතු අතර, මුදල් තැන්පතු පත්‍රිකාවේ අයදුම්කරුගේ **ජාතික හැඳුනුම්පත් අංකය** හා මෙම විභාගයට අදාළ විභාග කේත අංකය වන PE21101 යන්න සඳහන් කළ යුතුය.

**උදා:-**

| | | |
|---|---|---|
| ගිණුම් අංකය | - | 87262909 |
| ගිණුම් හිමියාගේ නම සහ ලිපිනය | - | **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත** |
| ජා.හැ.ප./ ගමන්බලපත්/රියදුරු බලපත් අංකය | - | අයදුම්කරුගේ **ජාතික හැඳුනුම්පත් අංකය** |
| දුරකථන අංකය | - | අයදුම්කරුගේ **ජංගම දුරකථන අංකය** |
| තැන්පතුවේ අවශ්‍යතාව | - | PE21101 |

(ඇ) මුදල් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරුකිරීමට ඉඩදෙනු නොලැබේ. **විභාග ගාස්තු ගෙවීම ඉහත සඳහන් බැංකු ගිණුමට පමණක් සිදු කළ යුතු අතර, වෙනත් කිසිදු අයුරකින් ගෙවීම් සිදු කළ නොහැකිය.** ( ATM යන්ත්‍ර මඟින් හා Online Banking මඟින්)

(ඉ) අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනම් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) විභාගය සඳහා පෙනී සිටීමේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(උ) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම. ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඌ) අවසන් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත වෙත ලබා දෙනු ඇත. එම ප්‍රතිඵල ලේඛනය www.psc.sp.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පියවර ගනු ඇත.

06. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - :**

විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික් උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය

කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මෙහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

07. **සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :-**

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් යම්කිසි කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය දකුණු පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

08. **තෝරා ගැනීමේ ක්‍රමය :-**

පහත සඳහන් අයුරින් ලකුණු ලබා දෙනු ඇත.

| | | ලකුණු |
|---|---|---|
| I. | අභියෝග්‍යතාව සහ සිද්ධි අධ්‍යයනය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 1යි විනාඩි 30යි) |
| II. | ජ්‍යෙෂ්ඨත්වය | 60 |
| III. | පළපුරුද්ද | 40 |
| | | 200 |

**විෂය නිර්දේශය :-**

I. අභියෝග්‍යතාව සහ සිද්ධි අධ්‍යයනය මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

(අ) පළමු කොටස (ලකුණු 40)

සියලුම ප්‍රශ්න කාර්යාල පරිපාලනයට සම්බන්ධ වන අතර, එහිදී සාමාන්‍ය දැනීම, තීරණ ගැනීමේ හැකියාව, තාර්කික විසඳීම හා කාර්යාල පරිපාලනයට සම්බන්ධ ගැටලු ඉදිරිපත් වනු ඇත.

(ආ) දෙවන කොටස (ලකුණු 60)

අපේක්ෂකයන්ට කාර්යාල පරිපාලනයට සම්බන්ධ සිද්ධි අධ්‍යයනය ගැටලුවකට හෝ ගැටලු කිහිපයකට හෝ පිළිතුරු සැපයීමට සිදුවේ. මෙහිදී ඡේදයකින් හෝ ඡේද කිහිපයකින් යුක්ත වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

* මෙම පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ඇත. සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි.

සටහන:

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨත්වය සහ පළපුරුද්ද සම්බන්ධව ඇතුළත් කරන ලකුණු එම නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනුව පදනම් කරගෙන ඇගයීමකට ලක් කරනු ලැබේ. පෞද්ගලික ලිපිගොනුවෙන් සනාථ නොවන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

II. ජ්‍යෙෂ්ඨත්වය

ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු දෙනු ලබන්නේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එක් වසරක් සඳහා ලකුණු 06 බැගින් ලකුණු 60 ක උපරිමයක් දක්වා පමණි. මෙහිදී මාස 06 කට වැඩි වර්ෂයකට අඩු සේවා කාලයක් සඳහා ලකුණු 03ක් ලැබෙන අතර, හය මසකට අඩු කාලයක් සඳහා ලකුණු දෙනු නොලැබේ.

III. පළපුරුද්ද

දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ අධීක්ෂණ නිලධාරියකු ලෙස සතුටුදායක එක් වසරක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40ක උපරිමයක් දක්වා ලකුණු ලබා දෙනු ලැබේ.

වෙනත්:

නව සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු I ශ්‍රේණියට උසස් වීමට අවස්ථාව ලැබී ඇති බැවින් 2013.04.02 දිනට පෙර පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියේ වසර 15 ක් සිට I ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන්ගේ සහ 2013.04.02 දින නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින වන විට II ශ්‍රේණියේ වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර සිටි නිලධාරීන්ගේ වසර 10කට වැඩි II ශ්‍රේණියේ අමතර වසරක සේවා කාලයකට ලකුණු 03 බැගින් උපරිම අමතර ලකුණු 15ක් හිමිවන ලෙස ලකුණු ලබා දෙනු ලැබේ.

09. **පත්වීම් සඳහා තෝරා ගැනීම :-**

අභියෝග්‍යතාව සහ සිද්ධි අධ්‍යයන ලිඛිත පරීක්ෂණයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ ලකුණු මත සහ ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද පදනම් කර ගෙන දෙනු ලබන මුළු ලකුණු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙළට, සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව තෝරා ගනු ලැබේ.

10. පත් කිරීමට පෙර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර එහිදී ලකුණු දීමක් කරනු නොලැබේ.

11. විභාගයෙන් සමත්වන යම් අපේක්ෂයකු එම පත්වීම පිරිනමන අවස්ථාවේදී බලපවත්වන රෙගුලාසි හා විධි විධානයන් යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ හැසිරීම කරණකොට ගෙන හෝ පත්වීම් නොදීමේ අයිතිය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සී.පී. රාජකරුණා,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

(**සැලකිය යුතුයි** - ඔබ ආයතනයට අනුබද්ධ ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු මෙම කුසලතා තරග විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් කරුණාකර ඔවුන් දැනුම්වත් කිරීමට කටයුතු කරන්න.)